පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
**PARLIAMENT**

30 නොවැම්බර් 2019

මාධ්‍ය නිවේදනය

බහුතරයක් ශ්‍රී ලාංකික ජනතාව තම ව්‍යවස්ථානුකූල අයිතිය උපයෝගී කරගෙන නව පාලනයක් ස්ථාපිත කරගනු ලැබීය.

මුලුමහත් ජනතාවම බලාපොරොත්තු වූයේ සාමකාමී,නිදහස්,ප්‍රජාතන්ත්‍රවාදය රජයන පාලනයකි.

නව රජයක් බලයට පත්වූ සැනින්,එම ආණ්ඩුව විවේචනය කිරීම සාධාරණ නොවන බවත්,ඔවුනට සිය ජනවරමට අදාල කටයුතු කරගෙන යාම සඳහා කාලයක් දිය යුතු බවත් මම විශ්වාස කරමි.

කෙසේ වෙතත්, නව ආණ්ඩුව යටතේ ඇති වූ සහ ඇතිවෙමින් තිබෙන සිදුවීම් කිහිපයක්,තවදුරටත් අප නිහඬව සිටීම කළ නොහැකි තත්ත්වයට පත්කොට තිබේ .

ඇතැම් සිදුවීම් සංසුන් සමාජය බොහෝ සෙයින් භීතියට පත් කිරීමට හේතු වී තිබේ .

ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලයේ නිලධාරිනියක පැහැරගෙන යාමේ සිදුවීම මෙරට රාජ්‍ය තාන්ත්‍රික ඉතිහාසය තුල කලුපැල්ලමකි. එය ජාත්‍යන්තරව බලවත් අප්‍රසාදයක් අපේ රට කෙරෙහි ඉල්ල වන්නකි.

විශේෂයෙන්ම කීර්තිමත් සහ දක්ෂ පොලිස් නිළධාරීන් විශාල පිරිසකට එරෙහිව පලිගැනීමේ රාජ්‍ය හස්තය එල්ල වී තිබේ.

මාධ්‍යවේදීන් කිහිප දෙනෙක් වෙත දැනටමත් පීඩන එල්ල වී ඇති අතර එය අප විසින් දිනාදුන් අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසටත්,තොරතුරු දැනගැනීමේ අයිතියටත් එරෙහිව රාජ්‍ය තන්ත්‍රය ක්‍රියාත්මක වීමකි.

මේ රට සුරක්ෂිත කිරීම, පලිගැනීමට තිත තැබීම, ආර්ථිකය ශක්තිමත් කිරීම සහ ශ්‍රී ලංකාව ලෝකයේ ඉහලින් ඔසවා තැබීමේ පොරොන්දුව මත ඔවුන් වෙත ජනතාව ලබාදුන් ජනවරම පලුදුවන ලෙස කටයුතු සිදුවීම කනගාටුවට කරුණකි.

අපක්ෂපාතී,නීතිගරුක නිළධාරීන් දේශපාලන දඩයමට ලක් කිරීමත්,මාධ්‍යවේදීන් සහ ආයතනවල නිදහසට සීමා පැනවීමත්,ප්‍රතිවාදීන්ගෙන් පලිගැනීමත් සිහිපත් කරන්නේ 2015ට පෙර මෙරට තිබූ අන්ධකාර සමය ය.

මෙම කණගාටුදායක තත්ත්වය කෙරෙහි අපගේ බලවත් අවධානය යොමුව ඇති අතර ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ පෞද්ගලික අවධානයට යොමු කරමි.

තම පාර්ශවය නියෝජනය කරන අයට සේම තම මතය නියෝජනය නොකරන අයටද නිදහසේ ජීවත්වීමේ අයිතිය මේ රටතුල තිබිය යුතුය.නව ජනාධිපතිවරයා ලෙස ඔහු වැඩභාර ගත්තේද ඒ බවට පොරොන්දු වෙමිනි.

එහෙත් සිදුවෙමින් පවතින යටකී කාරණා ඔහුගේ පොරොන්දුව පිටුපා යන්නකි.

ඔහු ඇතුලු නව ආණ්ඩුව විසින් ශ්‍රී ලංකාවාසී ජනතාවට පොරොන්දු වූ නිදහස් සාමකාමී රට බිහිකරන ලෙසත්,ඉහත සිදුවීම් පිලිබඳව අපක්ෂපාතී පරීක්ෂණ පවත්වන ලෙසත්, අනෙකාගෙන් පලිගැනීමේ ක්‍රියාවලියට රාජ්‍ය තන්ත්‍රය යොමු නොකරන ලෙසත් ඉල්ලා සිටිමි.

පාර්ලිමේන්තු මන්ත්‍රී

සජිත් ප්‍රේමදාස